AL/2026/25 A/S-II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**ඉන්දීය ඉතිහාසය II (I කොටස)**
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

**25 A | S | II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය** | **- මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
※ **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
※ **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | **1 - 6** | |
| 2 | **7 - 16** | |
| 3 | **17 - 22** | |
| 4 | **23 - 27** | |
| 5 | **28 - 35** | |
| 6 | **36 - 40** | |
| **එකතුව** | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) අන්නමලෙයි (2) සත්පුර (3) නිල්ගිරි
(4) කාරකෝරුම් (5) නැගෙනහිර ඝාට්ස් (.........)

**2.** (1) බියස් (2) රාවි (3) චෙනාබ්
(4) ජේලම් (5) නර්මදා (.........)

**3.** (1) සූරසේන (2) ආන්ධ්‍ර (3) කුරු
(4) පංචාල (5) මත්ස්‍ය (.........)

**4.** (1) මල්ල (2) විදේහ (3) කෝලිය
(4) අවන්ති (5) මෝරිය (.........)

**5.** (1) පූර්ණ කස්සප (2) මක්ඛලී ගෝසාල (3) ස්වේතාම්බර
(4) අජිත කේශකම්බල (5) සංජය බෙල්ලට්ඨිපුත්ත (.........)

**6.** (1) තක්ෂිලා (2) චම්පා (3) වාරානසී
(4) මථුරා (5) ප්‍රතිෂ්ඨාන් (.........)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



7. (1) ෂහාෂ්ගර් සෙල්ලිපිය (2) මන්සේහ්රා සෙල්ලිපිය (3) ගිර්නාර් සෙල්ලිපිය
(4) ධෞලි සෙල්ලිපිය (5) නාසික් සෙල්ලිපිය (.........)

8. (1) මේඝදූත (2) මෘච්ඡකටිකා (3) රඝුවංශ
(4) ඍතුසංහාර (5) කුමාරසම්භව (.........)

9. (1) සිංහවිෂ්ණු (2) I මහේන්ද්‍රවර්මන් (3) නන්දිවර්මන්
(4) වරගුණවර්මන් (5) අපරාජිතවර්මන් (.........)

10. (1) විජයාලය (2) ආදිත්‍ය (3) වික්‍රමාදිත්‍ය
(4) I පරන්තක (5) I රාජරාජ (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) ඉන්ද්‍ර - යුද්ධයට අධිපති දෙවියා
(2) යම - මරණයට අධිපති දෙවියා
(3) විෂ්ණු - විනාශයට අධිපති දෙවියා
(4) අග්නි - ගින්නට අධිපති දෙවියා
(5) කුවේර - ධනයට අධිපති දෙවියා (.........)

12. (1) අවන්ති - චණ්ඩපජ්ජෝත
(2) කාසි - වත්සකාර
(3) අංග - බ්‍රහ්මදත්ත
(4) වත්ස - උදයන
(5) කෝසල - විඩූඩභ (.........)

13. (1) කාලිදාස - මාලවිකාග්නිමිත්‍ර
(2) විසාකදත්ත - මුද්‍රාරාක්ෂස
(3) භාරවී - අමර්කෝෂ
(4) හර්ෂවර්ධන - රත්නාවලී
(5) I මහේන්ද්‍රවර්මන් - මත්තවිලාසප්‍රහසන (.........)

14. (1) දමන - කෝසල
(2) ව්‍යාග්‍රරාජ - මහාකාන්තාර
(3) ස්වාමිදත්ත - කොට්ටූර
(4) විෂ්ණුගෝප - කාංචි
(5) හස්තිවර්මන් - වෙංගි (.........)

15. (1) කණිෂ්ක - රුද්‍රදාමන්
(2) රාජ්‍යවර්ධන - සසංක
(3) හර්ෂවර්ධන - II පුලකේෂින්
(4) ධර්මපාල - වත්සරාජ
(5) I පරන්තක - III කෘෂ්ණ (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| X | Y |
|---|---|
| (i) ඉන්ද්‍රප්‍රස්ථ | A - නර්මදා |
| (ii) ප්‍රතිෂ්ටාන් | B - චම්බාල් |
| (iii) උජ්ජේනි | C - ගෝධාවරී |
| (iv) භාරුකච්ඡ | D - ගංගා |
| (v) කනෞජ් | E - යමුනා |

(1) E A B C D (2) E A C B D (3) E C A B D (4) E C B A D (5) E C D A B (.........)

**17.**

| X | Y |
|---|---|
| (i) හෙරඩෝටස් | A - ටිබෙට් |
| (ii) ප්ලිනි | B - ග්‍රීක් |
| (iii) අල්බිරූනි | C - චීන |
| (iv) ෆාහියන් | D - පර්සියන් |
| (v) තාරානාථ | E - රෝම |

(1) A B D C E (2) B D E C A (3) B E A C D (4) B E D A C (5) B E D C A (.........)

**18.**

| X | Y |
|---|---|
| (i) අන්තපාල | A - භාණ්ඩාගාරික |
| (ii) අන්තර්වශික | B - ප්‍රධාන අයකැමි |
| (iii) සමාහර්ත | C - අන්තඃපුර පාලක |
| (iv) සන්නිධාතා | D - බලකොටු භාර නිලධාරියා |
| (v) දුර්ගපාල | E - රාජ්‍ය සීමා ආරක්ෂකයා |

(1) A D C B E (2) E A B D C (3) E C B A D (4) E D B C A (5) E C D A B (.........)

**19.**

| X | Y |
|---|---|
| (i) ආදිත්‍ය | A - I කෘෂ්ණ |
| (ii) දන්තිදුර්ග | B - කනිෂ්ක |
| (iii) ධ්‍රැව | C - පරන්තක |
| (iv) වීම කැඩ්පයිසීස් | D - කුණාල |
| (v) අශෝක | E - III ගෝවින්ද |

(1) A D C B E (2) A C E B D (3) C A D B E (4) C A E B D (5) C B E A D (.........)

**20.**

| X | Y |
|---|---|
| (i) ගංගෙයිකොණ්ඩ චෝළ | A - I රාජරාජ |
| (ii) වාතාපිකොණ්ඩ | B - I නරසිංහවර්මන් |
| (iii) මුම්මුඩිචෝළ | C - II පුලකේෂීන් |
| (iv) සකල උත්තරාපථනාථ | D - I රාජේන්ද්‍ර |
| (v) පරමේෂ්වර | E - හර්ෂවර්ධන |

(1) B A D E C (2) B D A E C (3) D A B E C (4) D B A E C (5) D E A C B (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21.** **පශ්චාත් වෛදික යුගය**

(1) මෙම අවධියේ දී සංස්කෘතිය කේන්ද්‍රගතව පැවතියේ කුරුක්ෂේත්‍ර හා මධ්‍යදේශයේ ය.
(2) ඍග් වෛදික යුගයේ පැවති ගෝත්‍ර මූලික සමාජ ක්‍රමය පශ්චාත් වෛදික යුගයේ දී ද එසේම ප්‍රබලව පැවතුණි.
(3) ශුද්‍රයන් අශුද්ධ කණ්ඩායමක් ලෙස සැලකී ය.
(4) වර්ණ ක්‍රමය මෙම සමාජය තුළ දැඩිව ස්ථාපිතව පැවතුණි.
(5) මේ අවධියේ දී කුරුක්ෂේත්‍රයේ හා මධ්‍යදේශයේ සාරවත් තැනිතලා, වැසියන්ගේ භෞතික සමෘද්ධිය වර්ධනය කළේය. (.........)

**22.** **මහා ඇලෙක්සැන්ඩර්**

(1) මහා ඇලෙක්සැන්ඩර් ඉන්දියාවට ඇතුළුවන විට මගධයේ පාලකයා වූයේ ධනනන්ද ය.
(2) තක්ෂිලා හි පාලක අම්භි යුද භටයන්ගෙන් යුත් බලඇණියක් ලබාදෙමින් මහා ඇලෙක්සැන්ඩර්ට ආධාර කළේය.
(3) ග්‍රීක සෙබළුන් තවදුරටත් ඉදිරියට යාම ප්‍රතික්ෂේප කළ නිසා මහා ඇලෙක්සැන්ඩර්ට බියස් නදියෙන් ඔබ්බට යාමට නොහැකි විය.
(4) ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණය බටහිර ලෝකය සමග සෘජු සම්බන්ධතාවකට ඉන්දියාවට මග පෑදීය.
(5) ඉන්දියාවෙන් ඉවත්වයාමට පෙර ඇලෙක්සැන්ඩර් තමන් ජයගත් ඉන්දියානු ප්‍රදේශවල පාලකයා වශයෙන් සෙලියුකස් නිකේටර් පත්කළේ ය. (.........)

PAST PAPERS WIKI

Past Papers Wiki



**23.** **හියුං සාං**

(1) ඉන්දියාවට පැමිණි චීන වන්දනාකාර භික්ෂුවක් වූ හියුං සාං බෞද්ධ ආගමික ග්‍රන්ථ සංස්කෘත භාෂාවෙන් චීන භාෂාවට පරිවර්තනය කළේ ය.
(2) හර්ෂවර්ධන රජුගේ පාලන සමයේදී හියුං සාං ඉන්දියාවට පැමිණියේ ය.
(3) කනෞජ් රාජධානියේ රාජ්‍යතාන්ත්‍රිකයන් සහ ඇමතිවරුන් විසින් එම රාජ්‍යයේ කිරුළ භාරගන්නා ලෙස හර්ෂවර්ධනට ආරාධනා කරන ලද බව හියුං සාං සඳහන් කරයි.
(4) හර්ෂවර්ධන විසින් හියුං සාං ඔහුගේ උපදේශකයෙකු ලෙස පත් කර ගත්තේ ය.
(5) ප්‍රයාගයේ දන්දීමේ උත්සවයෙන් පසු හියුං සාං ඉන්දියාවෙන් නික්ම ගියේ ය. (.........)

**24.** **පාණ්ඩ්‍යයන්**

(1) පාණ්ඩ්‍ය ජනයා කාන්තාවන් විසින් පාලනය කරන ලද බව මෙගස්තිනිස් සඳහන් කොට තිබේ.
(2) ඛාරවේලගේ හතිගුම්ඵා සෙල්ලිපියේ ඔහු විසින් පාණ්ඩ්‍ය රජු පරාජය කළ බව වාර්තාකොට තිබේ.
(3) ස්ට්‍රාබෝට අනුව පාණ්ඩ්‍ය රජු රෝම අධිරාජයා වෙත දූත පිරිසක් යවා ඇත.
(4) I පරන්තක පාණ්ඩ්‍ය බල ප්‍රදේශ ආක්‍රමණය කරන ලද අතර එම ජයග්‍රහණය සිහිපත් කිරීම සඳහා මධුරෙයි කොණ්ඩ යන විරුදය භාවිත කළේ ය.
(5) I මහේන්ද්‍රවර්මන් පාණ්ඩ්‍ය රාජධානියේ අවසන් පාලකයා විය. (.........)

**25.** **සාතවාහනයන්**

(1) සාතවාහනයන් පුරාණ ග්‍රන්ථවල ආන්ද්‍රයන් ලෙස හඳුන්වා ඇත.
(2) සාතවාහන රාජ්‍යයේ ආරම්භක පාලකයා වූ සිමුක බලයට පැමිණියේ කාන්වයන්ගෙන් පසුව ය.
(3) ඩෙකානයේ පළමු රාජවංශය වූ සාතවාහනයෝ, දක්ෂිණාපථයේ අධිරාජ්‍යයක් පිහිටවූහ.
(4) දැඩි බ්‍රාහ්මණ ආගමිකයන් පිරිසක් වූ සාතවාහනයෝ තම රාජධානිය තුළ බෞද්ධාගම නොඉවසූ හ.
(5) සාතවාහනයන් යටතේ ඉන්දු-රෝම වෙළෙඳාම එහි උච්චතම තත්ත්වයට පත්විය. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** **මහාභාරතය** සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) මහාභාරතය ඉන්දියාවේ බිහි වූ මහාකාව්‍ය දෙක අතුරින් එකකි.
(B) මහාභාරතයේ කර්තෘවරයා වාල්මීකි ය.
(C) මහාභාරතය, කෞරවයන් සහ පාණ්ඩවයන් අතර සිදු වූ යුද්ධය හා සම්බන්ධ සිදුවීම් විස්තර කරයි.
(D) මහාභාරත යුද්ධය සිදුවූයේ ඩෙකාන් ප්‍රදේශයේ ය. (.........)

**27.** **හරප්පා ශිෂ්ටාචාරය** සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) හරප්පා නගරය රාවි ගඟ ආසන්නයේ පිහිටා තිබුණි.
(B) හරප්පා නගරයේ නටබුන් අතර රාජකීය සොහොන් හෝ මාලිගාවල නටබුන් හෝ දක්නට නැත.
(C) මහා ධාන්‍යාගාරයක නටබුන් මොහෙන්ජොදාරෝ නගරයෙන් හමු වී ඇත.
(D) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ විශාලතම නගරය හරප්පාව යි. (.........)

**28.** **මෙගස්තිනිස්** සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) මෙගස්තිනිස් යනු චන්ද්‍රගුප්ත මෞර්යයගේ රාජ සභාවට සෙලියුකස් නිකේටර් විසින් යවන ලද ග්‍රීක තානාපතිවරයා ය.

(B) මෙගස්තිනිස් පාඨලීපුත්‍රයේ නැවතී සිටි කාලය අවිනිශ්චිත වන බැවින් උගතුන් අතර ඒ ගැන මතභේද පවතී.

(C) මෙගස්තිනිස් විසින් ලියන ලද ඉන්ඩිකා ග්‍රන්ථයේ මුල් පිටපත විනාශ වී ඇතත්, පසුකාලීන ග්‍රීක හා ලතින් ලේඛකයන් විසින් එම ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලද ඇතැම් කොටස් ආරක්ෂා වී ඇත.

(D) ඉන්දියාව පිළිබඳ ලිඛිත තොරතුරු ඉතිරි කර ඇති බටහිර ලෝකයේ පළමුවැන්නා මෙගස්තිනිස් ය.

(.........)

**29.** **ශකවරුන්** සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ඉන්දියාවේ ශකවරුන් යටතේ පැවති ප්‍රදේශ ශකස්ථාන යනුවෙන් හඳුන්වනු ලැබී ය.

(B) මුල් ම ශක පාලකයා මාවුස් වූ අතර ඔහුගේ අගනුවර වූයේ තක්ෂිලාව යි.

(C) ශකවරුන් යටතේ පැවති පාලන ප්‍රදේශ ශත්‍රපවලට බෙදා තිබිණ.

(D) වයඹදිග ඉන්දියාවේ ශකවරුන්ගෙන් පසු බලයට පැමිණියේ ඉන්දු-ග්‍රීකයෝ ය. (.........)

**30.** **පල්ලවයන්** සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) චෝළ අධිරාජ්‍යය බිඳවැටීමෙන් පසු පල්ලවයෝ දකුණු ඉන්දියාවේ බලයට පැමිණිය හ.

(B) කෘෂ්ණ නදියේ සිට ඉන්දියාවේ දකුණු කෙළවර දක්වා විහිදගිය අධිරාජ්‍යයක් පිහිටුවීමට පල්ලවයෝ සමත්වූ හ.

(C) ශෛලමය හින්දු දේවාල ඉදිකිරීමේ කලාව දකුණු ඉන්දියාවට හඳුන්වා දෙන ලද්දේ I මහේන්ද්‍රවර්මන් රජු ය.

(D) මහබලිපුරම් නගරය පිහිටුවන ලද්දේ I නරසිංහවර්මන් රජු විසිනි. (.........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** සංගම් සාහිත්‍යය සමෘද්ධියට පත්වූයේ කවර පාලකයින්ගේ අනුග්‍රහය යටතේ ද?

(1) චෝළ (2) පාණ්ඩ්‍ය (3) පල්ලව
(4) චාලුක්‍ය (5) රාෂ්ට්‍රකූට (.........)

**32.** දකුණු ඉන්දියාවට ආර්ය සංස්කෘතිය හඳුන්වා දුන් ඍෂිවරයා ලෙසට සලකනු ලබන්නේ:

(1) විශ්වමිත්‍ර (2) වසුබන්දු (3) භරත
(4) අගස්ත්‍ය (5) වාල්මීකී (.........)

**33.** පහත සඳහන් නගර අතරින් ලිච්ඡවී සමූහාණ්ඩුවේ අගනුවර කුමක් ද?

(1) කුසිනාරා (2) සාකේත (3) මිථිලා
(4) මථුරා (5) වෛශාලී (.........)

**34.** සුදර්ශන ජලාශය ඉදිකරවන ලද්දේ කුමන මෞර්ය පාලකයාගේ රාජ්‍ය සමයේ ද?

(1) චන්ද්‍රගුප්ත මෞර්ය (2) බින්දුසාර (3) අසෝක
(4) දසරථ (5) කුණාල (.........)

**35.** හතරවන බෞද්ධ සංගායනාවෙන් අනතුරුව මහායාන ග්‍රන්ථ රචනා කරන ලද්දේ කුමන භාෂාවෙන් ද?

(1) පාලි (2) ප්‍රාකෘත (3) සංස්කෘත
(4) ටිබෙට් (5) චීන (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | සිරියානු අධිරාජයා ඩයිමාකෝස් නම් තානාපතිවරයකු බින්දුසාරගේ රාජ සභාවට යැවී ය. | ඩයිමාකෝස් පාඨලීපුත්‍රයේ නාගරික පාලනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබා දී ඇත. | (.........) |
| **37.** | ඛාරවේලගේ අභාවයෙන් පසු අසෝක රජු කාලිංගය ජයගත්තේ ය. | ඛාරවේලගේ කාර්ය සංසිද්ධීන් පිළිබඳ තොරතුරු හතිගුම්ඵා සෙල්ලිපියෙහි අඩංගුව ඇත. | (.........) |
| **38.** | එල්ලෝරා ගුහාවල ඇති කලා නිර්මාණ බෞද්ධ, ජෛන හා හින්දු යන ආගම් නියෝජනය කරයි. | මහාරාෂ්ට්‍රයේ එල්ලෝරාහි ගලින් කරන ලද ලෙන් නිර්මාණ 30 කට වැඩි ප්‍රමාණයක් දැකිය හැකිය. | (.........) |
| **39.** | හර්ෂවර්ධනගේ මියයාමත් සමඟම යසෝවර්මන් කනෞජයේ බලයට පැමිණියේ ය. | පළමුවන නාගභට නම් ප්‍රතිහාර රජු විසින් යසෝවර්මන් පරාජය කරන ලදී. | (.........) |
| **40.** | තෝරමාන වයඹදිග ඉන්දියාවේ ප්‍රදේශ අල්ලාගෙන ඉන්දියාවේ හූණ බලය පිහිටුවී ය. | තෝරමානගෙන් පසු ඔහුගේ පුත්‍ර මිහිරකුල බලයට පැමිණි අතර පළමුවන මහේන්ද්‍රපාලගේ මූලිකත්වයෙන් යුත් ඒකාබද්ධ හමුදාවක් විසින් ඔහු පරාජය කරන ලදී. | (.........) |

⁂ ⁂

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ඉන්දීය ඉතිහාසය II
இந்திய வரலாறு II
History of India II
**25 A** **S**

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ..................................



Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**ඉන්දිය ඉතිහාසය II (II කොටස)**
**இந்திய வரலாறு II (பகுதி II)**
**History of India II (Part II)**

**25 A** **S** **II**

**ඉන්දිය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

※ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**

※ **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.

※ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) බෝලාන් කපොල්ල (ii) සත්පුර කඳුවැටිය (iii) බියස් නදිය
(iv) ඉන්ද්‍රප්‍රස්ථ (v) ගංගෙයිකොණ්ඩචෝළපුරම් (vi) නැගෙනහිර ඝාට්ස්
(vii) තුංගබද්‍රා නදිය (viii) ගිර්නාර් (ix) සාංචි
(x) තාම්‍රලිප්ති (xi) මහානදී ගංගාව (xii) ප්‍රතිෂ්ඨාන්

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා බිඳවැටීම පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**3.** (i) පාටලීපුත්‍රය මගධයේ අගනුවර කරගත් පළමුවන රජතුමා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) අශෝක රජතුමා බලයට පැමිණීමට පෙර මගධය පාලනය කළ රාජවංශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) මගධය බිම්බිසාර රජතුමා යටතේ පැවති අවධියේ උතුරු ඉන්දියාවේ පැවති රාජධානි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iv) ක්‍රි.පූ. 6 වන සියවසේ සිට අශෝක රජවීම දක්වා කාලය තුළ මගධයේ දේශපාලන වර්ධනය විස්තර කරන්න.

(ලකුණු 10 යි)

**4.** මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමේ සිට ගුප්ත බලය ආරම්භවීම දක්වා වයඹදිග ඉන්දියාවේ විදේශීය ආක්‍රමණිකයන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් සැකෙවින් සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

PAST PAPERS WIKI

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) වයඹදිග දේශසීමාව
(ii) සොළොස් මහා ජනපද
(iii) සෙලියුකස් නිකේටර්
(iv) සාංග් වෛදික යුගයේ ආගමික තත්ත්වය (ලකුණු 08 × 2 = 16 යි)

[අවසැති පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## C කොටස

6. "ගුප්ත රජවරුන් අතර සමුද්‍රගුප්ත කැපීපෙනෙන පාලකයකු වන්නේ ඔහුගේ අසමසම යුදකාමී ස්වභාවය නිසා ය."
   - (i) සමුද්‍රගුප්තගේ පූර්වගාමියා නම් කරන්න. (ලකුණු 01 යි)
   - (ii) සමුද්‍රගුප්තගේ යුද ව්‍යාපාර පිළිබඳ තොරතුරු සපයන ටැම් ලිපිය නම් කරන්න. (ලකුණු 01 යි)
   - (iii) සමුද්‍රගුප්ත විසින් ඈඳාගන්නා ලද ආර්යාවර්තයේ රාජ්‍ය දෙකක පාලකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)
   - (iv) සමුද්‍රගුප්ත විසින් පරාජය කොට නැවත බලයේ පිහිට වූ දක්ෂිණාපථයේ රජවරුන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)
   - (v) "සමුද්‍රගුප්ත සැබවින්ම යුදකාමියෙකි." මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 10 යි)

7. හර්ෂවර්ධන රජතුමාගෙන් පසු කනෞජයේ ආධිපත්‍ය සඳහා පැවැති අරගලයේ ප්‍රධාන සිදුවීම් පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

8. චෝළ බලව්‍යාප්තිය පහත දැක්වෙන තේමා යටතේ පරීක්ෂා කරන්න.
   - (i) ඉන්දියාව තුළ ව්‍යාප්තිය (ලකුණු 10 යි)
   - (ii) ඉන්දියාවෙන් පිටත ව්‍යාප්තිය (ලකුණු 06 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   - (i) කුෂාණයන් යටතේ බුද්ධාගම
   - (ii) නාලන්දා විශ්වවිද්‍යාලය
   - (iii) පල්ලව කලාව හා ගෘහනිර්මාණ ශිල්පය
   - (iv) ධර්මපාල රජු

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library